# අළුත් කර්මාන්තයකට මග පෙන්වූ වල් බෙලි පට්ටා



වල් බෙලි

**ඉස්සර ඉන්දියාව, බංගලි දේශය වගේ රටවලත් ජූට් හණ ගස් වැවෙන්න ඇත්තේ බෙලිපට්ටා වගේ කැලෑවල. අපත් අප ගේ ස්වාභාවික සම්පත් ගැන විමසිල්ල යොමු කිරීමෙන් වල් බෙලි වැනි දේවලින් ප්‍රයෝජන ගන්න ඕනෑ තරම් ඉඩ තිබෙනවා. එවිට ජූට් හණ ගෝනි, හණ නූල් වැනි දේවලටත් පිටරටට ගැතිවන්නට ඕනෑ නැහැ.**


ආදි කාලේ ඉඳලම මිනිසා පැලෑටිවලින් ලබා ගන්නා නොයෙක් ස්වභාවික කෙඳි වර්ග ඔවුන් ගේ ප්‍රයෝජනයට යොදගත් බව ඔබ දන්නවා. මේ අතරේ කපු, සිසාල්, කෙනාෆ් (ඇඹුල්පලා), හණ, පොල් කෙඳි ප්‍රධාන තැනක් ගන්නවා. මේ කෙඳි රෙදි පිළි විවීමටත්, ගෝනි, හණ නූල්, මෙට්ට තැනීමටත් හා බුරුසු සෑදීම ආදියට යොද ගත්තා. කෘත්‍රිම නූල් වර්ග වෙළඳපොලට ඒමට පෙර මාළු දැල් සෑදීමට පවා ගත්තේ හණ නූල්.

අපට වසරකට හණ නූල් (ට්වයින්) සඳහා රුපියල දශ ලක්ෂ පහක් පමණ විදේශ විණිමය වැය කරනවා. ඒ විතරක් නෙවෙයි, ජූට් ගෝනි දශ ලක්ෂ 2.6 පමණ විවිධ කටයුතු උදෙසා මෙරටට උවමනා වෙනවා. හණ නූල් ගැන බලනවිට පොල් සැකසුම් මණ්ඩලයේ බුමුතුරුණු (කාපට්) තැනීමට වසරකට රාත්තල් 10,000 ක් ද, බැංකු වලට මසකට රාත්තල් 1,000 ක් ද, අධ්‍යාපන දෙපාර්තමේන්තුවට මසකට රාත්තල් 4,000 ක් ද, වී අලෙවි මණ්ඩලයට මසකට රාත්තල් 50,000 ක් සහ තැපැල් දෙපාර්තමේන්තුවට පාර්සල් එතීම ආදිය සඳහා වසරකට රාත්තල් 8,000 ක් ද, උවමනා වෙනවා.

ලෝකයේ ජූට් කෙඳි නිෂ්පාදනයේ සියයට අනූවක් ම තවම කෙරෙන්නේ ඉන්දියාවේ සහ බංගලි දේශයෙනු යි. ඒ රටවල හිතුමනාපයට මිළ හා සැපයීම් කොන්දේසි තීරණය කරන්නේ. මේ නිසා අපේ අවශ්‍යතාවලට ඒ රටවලට ගැතිවීමට සිදු වෙනවා පමණක් නොව, විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ද වැය වෙනවා.

මේ හේතුන් දේශීය වශයෙන් වැවෙන පැලෑටිවල කෙඳිවල තත්වය විමසා ජූට් කෙඳි වලට ආදේශයක් සොයා ගැනීමට පර්යේෂණ කිරීමට තුඩුදුන් හේතුවක් වුනා. මේ පර්යේෂණවල පුරෝගාමියෙක් වූයේ හණ සංස්ථාවේ අධ්‍යක්ෂ වරයකු වූද, ජනාවාස කොමිෂන් සභාවේ කෘෂිකර්මය පද නම් වන කර්මාන්ත පිළිබඳ උපදේශක වරයකු වූද, ඔලිවර් ජී. අල්විස් මහතා යි. 1969 පමණ කාලේ සිට මෙරට දිගු කෙඳි වලින් යුතු පැලෑටි පිළිබඳව සොයාබැලීම් රැසක් ඔහු කර ගෙන ගියා. ස්වාභාවිකව වැවෙන කෙඳි ලබා ගත හැකි වෘක්ෂලතා රැසක් මෙහි දී ඔහුගේ පර්යේෂණවලට භාජනය වුවා. එසේ කර

ගෙන ගිය පර්යේෂණ අනුව හණ නූල් සෑදීම සඳහා ආදේශකයක් හැටියට යොදවා ගත හැකි කෙඳි වලින් යුතු ඉතා ප්‍රයෝජනවත් පැලෑටිය හැටියට පෙනී ගියේ මැල්වේසී පැලෑටි පවුලට අයත් වල්බෙලි (හිබිස් කස් ටිලිප්සියස්) පැලෑටිය යි. ඉතාම සශ්‍රීක ලෙස මෙය වැවෙන්නේ වගුරු බිම් ආශ්‍රිතවයි. මෙම පැලෑටිය නිරිතදිග වෙරළ බඩ ප්‍රදේශ වල අක්කර 6,000–7,000 ක පමණ ස්වභාවිකව වැවෙන බවට ඇස්තමේන්තු කර තිබෙනව.



ඔලිවර් ජී. ද අල්විස් මහතා නියම තත්වයට මේරූ වල් බෙලි අත්තක පට්ටා පෙන්වයි.

ඒ වනවිටත් මේ පැලෑටියෙන් ලබා ගන්නා කෙඳි වර්ග වලින් කෙරෙන සුළු ගෘහ කර්මාන්ත පැවතුනා. ඒ විතරක් නොවෙයි. මේ පළාත්වල පුරාණ කාලයේ මී හරකුන් බැඳීමට කඹ, තිරික්කලවල තෝන් ලණු, නාස් ලණු සාද ගත්තේත් වල්බෙලිපට්ටා කෙඳි වලිනු යි. මඩ වගුරු වල මී හරකුන් බැඳීමට පාවිච්චිකළත් බොහෝ කලක් නොදිරන ශක්තියක් එම කෙඳි වලට තිබුණා. ඇත්තවශයෙන්ම ඔහු ගේ පර්යේෂණවලට මෙම පැලෑටි යොද ගැනීමට තුඩු දුන් එක හේතුවක් ඒ කෙඳි පිළිබඳව පාරම්පරිකව ජනතාව අතර තිබූ පිළිගැනීම යි. ඔහු කලේ එය රටට ම ප්‍රයෝජනවත් වන අන්දමට ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම යි.

ඊළඟට වාණිජමය පදනමක් මත භෝගය වැවීමට හැකි ද යන්නත් සොයා බැලුවා. වල් බෙලි, කෙනාෆ් වගේ වාර්ෂික බෝග යක් නොවේ, එය ස්ථිර බෝගයක්. ඒ වගේ ම වැවීම පහසු යි. සීඝ්‍රයෙන් වැවෙනවා. දූනට ආහාර බෝග වැවෙන ඉඩම් වල නොව ඊට නුසුදුසු ආන්තික ඉඩම්වල වැවීමට සුදුසු පැලෑටියක් සොයා ගැනීම එහි දී ඔහු ගේ තවත් අපේක්ෂාවක් වුනා. වැවීමට යොදවා නොගන්නා නිසරු බිම් යනාදිය මේ පැලෑටිය වැවීමට යොදගත් නිසා අපතේ යන ඉඩම් වලින් ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වුනා.



"ලිට්ල් ඔලිවර්" හණ නූල් කටින යන්ත්‍රය

ඉතින් ශ්‍රී ලංකාවේ මෙතෙක් නොපැවති කර්මාන්තයක් වූ වල්බෙලිපට්ටා වලින් හණ නූල් නිපදවීමට ඊළඟට අවශ්‍ය වූයේ එම කෙඳි වලින් නූල් කැටිය හැකි අන්දමේ කටින යන්ත්‍රයකු යි. මෙහි කෙඳිවල දිගු බව


නිසා ඊට විශේෂ යන්ත්‍රයක් නිපදවියයුතු වුනා. සෑහෙන කලක් මහන්සි වීමෙන් අල්විස් මහතාට ඒ උදෙසා විශේෂ යන්ත්‍රයක් නිපදවීමට හැකි වුනා. ඔහු එය 'ලිට්ල් ඔලිවර්' යයි නම් කර තිබෙනවා. මේ යන්ත්‍රයක් නිපදවීමට රු. 450.00 ක් පමණ වැය වෙනවා.



**කඩුවෙල ප්‍රදේශයේ වල් බෙල් පට්ටා වලින් හණ නූල් සෑදීමේ කර්මාන්තයේ යෙදී සිටින පිරිසක්.**

ගම්මට්ටමේ තාක්ෂණික තත්ත්වයන් උපයෝගී කර ගෙන වල්බෙලි වවා ගැනීමටත් ඒවා කෙඳි වලට සකස් කර හණ (ට්වයින්) නූල් බවට පත් කිරීමටත් පුළුවනි. එක් යන්ත්‍රයකට දිනකට අවශ්‍ය කෙඳි ප්‍රමාණය රාත්තල් තුනක් පමණි. එය වල් බෙලි පට්ටා පැල දෙකකින් ලබා ගත හැකි යි. දින 300 කට අවශ්‍ය වන ප්‍රමාණය සපයා ගැනීමට පැල 600–700 ක් වවා ගත යුතු වෙනවා.

යන්ත්‍ර 100 කින් යුතු මධ්‍යස්ථානයක් සඳහා වල්බෙලි පට්ටා අක්කර 25–30 ක පැල කළයුතුයි. එක් පැලයකට අක්කර 1/4 පමණ අවශ්‍ය වේ. වසරකට තුන් වතාවක්



**ඔතන හණ නූල්, වොලිබෝල් දැල් මා දැල් හා තවත් නොයෙකුත් අවශ්‍යතාවලට අනුරූප වන පරිදි සකස් කරන ලද නූල්.**

අස්වනු කපා ගත හැකියි. යන්ත්‍ර 100 මුර තුනකට වැඩ කිරීමට මිනිසුන් 300 දෙනෙක් පූර්ණකාලීනව යොදවා ගත හැකි යි. මෙයට අමතරව තවත් 80 දෙනෙක් පමණ මාස 4-5 කට වල්බෙලි පට්ටා අතු කපා පල් කිරීමට, කෙඳි පිරිසිදු කිරීමට හා බේල් කිරීමට ආදී වශයෙන් යොදවා ගත හැකි යි. එක් එක් යන්ත්‍රයකින් දිනකට හණ නූල් රාත්තල් 2 1/2 – 3 දක්වා ප්‍රමාණයක් නිපදවිය හැකි අතර, මේ හණ නූල් එක් රාත්තලක් රු. 3.00—3.50 කට අලෙවි කළ හැකි යි.

**(ප්‍රවෘත්ති/ප්‍රකාශන නිලධාරි සරත් දයානන්ද විසිනි)**

# 'ගොවි ජනතාව' - ශත 25 ට

| | | |
|---|---|---|
| **1974 අප්‍රේල්** | ... | ශ්‍රී ලංකාවේ ගොවි ගැටළු 1 – ගාල්ල, මාතර, රත්නපුර, කුරුණෑගල, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ යාපනය දිස්ත්‍රික්කවල ගොවි මහතුන් මුහුණපාන ප්‍රශ්න. |
| **1974 ජූලි** | ... | ශ්‍රී ලංකාවේ ගොවි ගැටළු 2 – අම්පාර, කෑගල්ල, යාපනය දිස්ත්‍රික්කවල ගොවි මහතුන් මුහුණපාන ප්‍රශ්න<br>කෘෂිකාර්මික ඉඩම් පනත. |
| **1974 නොවැම්බර්** | ... | කෘෂිකර්ම රක්ෂණ ක්‍රමය<br>ගොවිපලක් සංවිධානය කර ගන්නා හැටි<br>වී ගොවිතැන පිළිබඳ විස්තරාත්මක විශේෂාංගයක් |
| **1975 අගෝස්තු** | ... | සාමූහික ජනාවාස හා සාමූහික නිෂ්පාදනයේ වාසි,<br>ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට මාර්ග,<br>පලදා වර්ධන කමිටු හා ගොවි කාරක සභාවල කාර්ය භාරය |
| **1975 දෙසැම්බර්** | ... | ප්‍රසිද්ධ වතු ජනසතු කිරීම,<br>ගොවි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ගැටළු,<br>කෘමීන්ගෙන් මිනිසා ලබන ප්‍රයෝජන |
| **1976 මාර්තු** | ... | මහවැලි යෝජනා ක්‍රමය,<br>පලදා වර්ධන කමිටු හා ප්‍රාදේශීය සංවර්ධනය,<br>කිරි නිෂ්පාදනය |
| **1976 ජූලි** | ... | හේන් ගොවිතැන විද්‍යාත්මක කිරීම<br>ඌරාපොල ග්‍රාම සංවර්ධන සැළැස්ම<br>කුකුල් කොටුවක් හදා ගන්න |
| **1976 සැප්තැම්බර්** | ... | හල්දුම්මුල්ල උක් හකුරු කර්මාන්තය<br>උක් සමඟ අතුරු බෝග<br>කැලෑ වැනසුවොත් රටත් විනාසයි |
| **1976 දෙසැම්බර්** | ... | අපේ වන සම්පත<br>ජනාවාස පනත හා ඉඩම් ප්‍රවර්ධන පනත<br>ගොවිතැනට මෙට්‍රික් ක්‍රමය බලපාන හැටි |